මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය
நிதி, பொருளாதார உறுதிப்பாடு மற்றும் தேசியக் கொள்கைகள் அமைச்சு
**MINISTRY OF FINANCE, ECONOMIC STABILIZATION AND NATIONAL POLICIES**

| | | |
|---|---|---|
| මහලේකම් කාර්යාලය, කොළඹ 01, ශ්‍රී ලංකාව | செயலகம், கொழும்பு 01, இலங்கை. | The Secretariat, Colombo 01, Sri Lanka. |
| කාර්යාලය / அலுவலகம் / Office: 011-2484500, 011-2484600, 011-2484700 | ෆැක්ස් / தொலைநகல் / Fax: 011-2449823 | වෙබ් අඩවිය / இணையதளம் / Website: www.treasury.gov.lk |


| | | |
|---|---|---|
| මගේ අංකය / எனது இல / My No: NPD/DCB2024/Gen | ඔබේ අංකය / உமது இல / Your No: | දිනය / திகதி / Date: 2023.12.29 |

මුදල් අමාත්‍යාංශ චක්‍රලේඛ: MF/02/2023

සියලුම දිස්ත්‍රික් ලේකම්වරුන් වෙත,

## විමධ්‍යගත අයවැය වැඩසටහන - 2024

2024 වර්ෂය සඳහා වූ රාජ්‍ය අයවැය මඟින් නිවැරදි ග්‍රාමීය සංවර්ධන ප්‍රවේශයක් තුළින් ප්‍රාදේශීය විෂමතා අවම කරමින් රට තිරසරව සංවර්ධනය කිරීමට අරමුණු කර ඇති අතර, සවිමත් ග්‍රාමීය ආර්ථිකයක් බිහිකිරීම තුළින් සාර්ව ආර්ථික ඉලක්ක සපුරා ගැනීමට අපේක්ෂිතය. එම ඉලක්කයන් සපුරා ගැනීමේ ජාතික කර්තව්‍යයට දායකවීමේ අරමුණ ඇතිව 2024 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාත්මක කෙරේ.

2024 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන සඳහා ප්‍රතිපාදන **ජනාධිපති ලේකම් කාර්යාලයේ** වැය ශීර්ෂය යටතේ ලබාදීමට කටයුතු කෙරේ. රේඛීය අමාත්‍යාංශ, පළාත් සභා හා වෙනත් ආයතන හා ප්‍රභව මඟින් ප්‍රතිපාදන සලසා නොමැති ආර්ථික, අධ්‍යාපනික, සාමාජීය, ආගමික හා සංස්කෘතික කටයුතු ප්‍රවර්ධනය සඳහා අවශ්‍ය භෞතික යටිතල පහසුකම් ඇති කිරීම හෝ වැඩිදියුණු කිරීම මෙන්ම සමාජ සුභසාධනය ඉලක්ක කර ගත් ව්‍යාපෘති සඳහා විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ වෙන් කරනු ලබන ප්‍රතිපාදන නිසි පරිදි ආයෝජනය කරනු ලබන බවට වග බලා ගැනීම ඔබ වෙත පැවරෙන වගකීමකි.

විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම වඩාත් පහසු කිරීම උදෙසා පහත සඳහන් මාර්ගෝපදේශයන් නිකුත් කෙරේ. **2024 ජනවාරි 31** වන විට පහත සඳහන් එක් එක් අංශ යටතේ ක්‍රියාත්මක කළ හැකි ව්‍යාපෘති යෝජනා අදාළ පාර්ශ්ව වෙතින් ලබාගෙන දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ද සහිතව ප්‍රතිපාදන ලබා ගැනීම සඳහා ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය. ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය ප්‍රතිපාදන ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ඔබ වෙත ලබා දෙනු ඇත.

### 1. ව්‍යාපෘති හඳුනා ගැනීම

1.1 2024 වර්ෂයේ විමධ්‍යගත අයවැය වැඩසටහන ක්‍රියාත්මක කිරීම පිළිබඳව ඔබ ඇතුලු පළාත් ආණ්ඩුකාරවරු, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරු සහ සියලුම ප්‍රධාන ලේකම්වරුන්හට ගරු ජනාධිපතිතුමන් සහ ගරු අග්‍රාමාත්‍යතුමන් විසින් කැඳවන ලද රැස්වීම් හරහා මේ වන විටත් දැනුවත් කර ඇති බව සිහිපත් කරමි.

1.2 ඒ අනුව ප්‍රථමයෙන්, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව, සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් 2024 ජනවාරි මස 15 වන දිනට ප්‍රථම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු නියෝජිතයින් සහ දිස්ත්‍රික්ක මට්ටමේ ආයතන ප්‍රධානීන් කැඳවා මේ සම්බන්ධව දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

1.3 ඔබගේ දිස්ත්‍රික්කයට විමධ්‍යගත අයවැය යටතේ වෙන් කෙරෙන මූල්‍ය ප්‍රතිපාදනය ඇමුණුම 1 වගුවෙහි දැක්වේ. ඒ අනුව, ජනගහනය, දරිද්‍රතාවය, භූමි ප්‍රමාණය, ග්‍රාම නිලධාරී වසම් සංඛ්‍යාව සහ ප්‍රදේශයට සුවිශේෂී වූ සංවර්ධන අවශ්‍යතා අනුව එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට සහ/හෝ ග්‍රාම නිලධාරී වසමකට වෙන්වන දළ ප්‍රතිපාදන ප්‍රමාණය දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුව මගින් තීරණය කළ යුතුය.

1.4 ඊට සමගාමීව, ප්‍රාදේශීය ලේකම්වරුන් මගින් ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුව, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරයාගේ ප්‍රධානත්වයෙන් කඩිනමින්ම රැස්කොට, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ දේශපාලන හා සිවිල් සංවිධාන නියෝජිතයින් සහ කොට්ඨාශ මට්ටමේ සියලුම රාජ්‍ය නිලධාරීන් දැනුවත් කිරීමට කටයුතු කළ යුතුය.

1.5 ප්‍රාදේශීය ලේකම්වරයාගේ අධීක්ෂණය යටතේ ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ප්‍රදේශයේ දේශපාලන නියෝජිතයින්, ප්‍රජාව, ප්‍රජා සංවිධාන සහ ග්‍රාම නිලධාරී වසම වෙනුවෙන් සේවය සපයන රාජ්‍ය ආයතනවල නිලධාරීන්ගේ සහභාගීත්වයෙන්, ප්‍රදේශයේ ජනතාව රැස්කොට වැඩසටහන පිළිබඳව ප්‍රමාණවත් දැනුවත් කිරීමක් මගින් එක් එක් ග්‍රාම නිලධාරී වසම සඳහා පහත "2. සංවර්ධන අංශ" යටතේ දැක්වෙන අංශ අනුව ව්‍යාපෘති හඳුනා ගැනීම සිදු කළ යුතුය.

1.6 ඉහත 1.5 ට අනුකූලව, ග්‍රාම නිළධාරී වසම් මට්ටමින් හැකි සෑම විටම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරයාගේ සහ ප්‍රාදේශීය ලේකම්වරයාගේ මූලිකත්වයෙන් ප්‍රජාව දැනුවත් කිරීමට කටයුතු කළ යුතු අතර, අවම වශයෙන් ඔවුන් විසින් නම් කරනු ලබන නියෝජිතයින් / නිලධාරීන් මගින් මෙම කටයුත්ත මෙහෙයවිය යුතුය.

1.7 ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ප්‍රජාව දැනුවත් කිරීම සහ ව්‍යාපෘති හඳුනා ගැනීමේ කටයුතු සිදු කිරීම අදාළ වසමේ ආර්ථික සංවර්ධන නිලධාරී ගේ වගකීමකි. කිසියම් ග්‍රාම නිලධාරී වසමක ආර්ථික සංවර්ධන නිලධාරී තනතුර පුරප්පාඩු වීම හෝ එම තනතුරේ සේවය කරන නිලධාරියාගෙන් ප්‍රමාණවත් දායකත්වයක් මෙම වැඩසටහනට ලබා ගැනීම දුෂ්කර වන අවස්ථාවක දී එයට සුදුසු නිලධාරියෙකු ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සභාපතිවරයා සමග සාකච්ඡා කර ප්‍රාදේශීය ලේකම්වරයා විසින් පත් කළ යුතුය.

1.8 ග්‍රාම නිලධාරී වසම් මට්ටමින් ප්‍රජාව දැනුවත් කිරීම **2024 ජනවාරි මස 31 වන දිනට** පෙර සම්පූර්ණ කර, ව්‍යාපෘති හඳුනා ගැනීම අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

1.9 හඳුනාගන්නා ව්‍යාපෘතිවල ශක්‍යතාවය සතියක කාලයක් තුළ අදාළ රාජ්‍ය ආයතනවල දායකත්වයෙන් කඩිනමින් තහවුරු කර ගනිමින් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ ව්‍යාපෘති යෝජනා ලැයිස්තුව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ අනුමැතිය ලබා ගැනීම සඳහා ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ නිර්දේශය සහිතව දිස්ත්‍රික් ලේකම්වරයා වෙත යොමු කළ යුතුය.

1.10 ඔබගේ දිස්ත්‍රික්කයට වෙන් කෙරෙන **මුළු ප්‍රතිපාදනයෙන් 50% ක අවමයක්** භෞතික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘති (ඉදිකිරීම්) සඳහා වෙන් කිරීමට වග බලා ගත යුතුය.

1.11 ඉදිකිරීම් හා අලුත්වැඩියා කිරීම් සඳහා අරමුදල් වෙන් කිරීමට ප්‍රථමව එම ඉදිකිරීම යෝජිත අරමුණ සඳහා අනාගතයේදී බාධාවකින් තොරව යොදා ගත හැකි බව හා නඩත්තු කටයුතු සඳහා නිසි ක්‍රමවේදයක් සකස් කර ඇති බවට දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් විසින් සෑහීමකට පත්විය යුතුය.

1.12 ඉදිකිරීම් වැඩ සඳහා (ඉඩම් හිමිකම නිරවුල් කිරීම, සමිති ලියාපදිංචිය, සම්පත් අවශ්‍යතාවය, වෙනත් වගකිව යුතු ආයතනවල එකඟතාවය අවශ්‍ය නම් ලබා ගැනීම) ඇමුණුම් 2 හි දැක්වෙන පරිදි ප්‍රාදේශීය ලේකම් මඟින් ශක්‍යතා වාර්තාවක් ලබා ගත යුතුය.

1.13 පහත 2.14 යටතේ හැර, මෙම ප්‍රතිපාදන යටතේ පොදු කාර්යයන් සඳහා ව්‍යාපෘති ක්‍රියාත්මක කළ යුතු අතර එක් එක් පුද්ගලයන්ට හෝ පෞද්ගලික කටයුතු සඳහා සෘජු ප්‍රදාන ලබා නොදිය යුතුය.

1.14 පහත 2.15 යටතේ ව්‍යාපෘති නිර්දේශ කිරීමට පෙර, එම ආයෝජනය මඟින් නිශ්චිත වශයෙන් ජනනය කරන රැකියා ප්‍රමාණය, ප්‍රාදේශීය සම්පත් උපයෝගීතාව, අගය එකතු කිරීම, වෙළෙඳපොළ, සැපයුම් ජාල සහ ආදායම් බෙදීයාම වැනි සාධක පිළිබඳව විශ්ලේෂණයක් සිදුකර ප්‍රාදේශීය ලේකම්ගේ නිර්දේශය සහිතව දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙහි අනුමැතිය සඳහා යොමු කළ යුතුය.

## 2. සංවර්ධන අංශ

2.1 කොවිඩ් වසංගතය හා ඉන් පසුව ඉස්මතු වූ ආර්ථික අර්බුදය හේතුවෙන් මේ වන විට තාවකාලිකව නවතා ඇති රාජ්‍ය ප්‍රතිපාදන මඟින් ක්‍රියාත්මක කොට අවසන් අදියරේ ඇවතින එහෙත් අඩු පිරිවැයකින් නිමකළ හැකි මට්ටමේ සංවර්ධන ව්‍යාපෘති (ඉදිකිරීම්) ජනතාවට සේවයක් සැලසිය හැකි මට්ටමකට සම්පූර්ණ කිරීම.

2.2 සංචාරක ආකර්ෂණයන් ඇති ස්ථාන ආශ්‍රිත පොදු පහසුකම් ඇති කිරීම.

2.3 ග්‍රාමීය ප්‍රජා පානීය ජල සම්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

2.4 කුඩා ප්‍රමාණයේ ග්‍රාමීය විදුලි ව්‍යාපෘති/සුළු පරිමාණ විදුලිය සම්බන්ධතා දීර්ඝ කිරීම් (මෙම ව්‍යාපෘති 2024 වර්ෂය තුළදීම ක්‍රියාත්මක කර අවසන් කළ හැකි බවට ලංකා විදුලිබල මණ්ඩලය වෙතින් සහතිකයක් ලබාගත යුතුය) හා රජයේ ආයතන සහ පොදු ආගමික මධ්‍යස්ථාන වෙත වහලය මත සවිකරන සූර්ය පැනල පද්ධති ලබා දීම.

2.5 පළාත් මාර්ග, ග්‍රාමීය මාර්ග, අඩි පාරවල්, පියගැටපෙළවල්, පාලම්, බෝක්කු, ඒදඬු, කම්බි පාලම්, මාර්ග දෙපස කාණු පද්ධති වැනි ග්‍රාමීය ගමනාගමන පහසුකම් සම්පාදන හා වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

2.6 නිෂ්පාදනයන්ට වැඩි වටිනාකමක්/වැඩි මිලක් ලබා දෙන ආර්ථික කටයුතු වැඩි දියුණු කිරීමට ඉවහල් වන කඩමණ්ඩි/සතිපොළ/අලෙවි මධ්‍යස්ථානවල භෞතික යටිතල පහසුකම් ඇති කිරීම/නවීකරණය කිරීම හා ඒවාට අදාල සනීපාරක්ෂක පහසුකම් ඇති කිරීම /වැඩිදියුණු කිරීම.

2.7 ප්‍රාථමික හා ද්විතික පාසල්, ග්‍රාමීය රෝහල්, ග්‍රාමීය බෙහෙත් ශාලා (dispensary/ආයුර්වේද බෙහෙත් ශාලා) සහ මාතෘ හා ළමා සායනයන්හි භෞතික යටිතල පහසුකම් ඇති කිරීම හෝ වැඩිදියුණු කිරීම, භාණ්ඩ සැපයීම හා ඒවාට අදාල ප්‍රවේශ මාර්ග වැඩිදියුණු කිරීම.

2.8 ග්‍රාමීය ක්‍රීඩා පිටි සහ පුස්තකාල සඳහා පහසුකම් ඇති කිරීමේ හා සංවර්ධනය කිරීමේ ව්‍යාපෘති.

2.9 සුළු වාරිමාර්ග යටතේ කුඩා වැව්, ඇලවේලි, අමුණු, ජලබස්නා ස්ථාන සහ ජල පොකුණු, වගා ළිං, නළ ළිං ඉදිකිරීම සහ ප්‍රතිසංස්කරණය කිරීම.

2.10 කෘෂිකර්මාන්ත සංවර්ධනයට අදාළ කෘෂි මාර්ග, කමත් ඇතුළු සංවර්ධන කටයුතු.

2.11 ලියාපදිංචි සමිති / ප්‍රජාමූල සංවිධාන, පෙර පාසල්, ළමා නිවාස සහ වැඩිහිටි නිවාස සඳහා පහසුකම් සම්පාදනය / උපකරණ සැපයීම.

2.12 ආගමික මධ්‍යස්ථාන, ලියාපදිංචි දහම් පාසල්, සංස්කෘතික මධ්‍යස්ථාන යනාදිය සඳහා පහසුකම් සම්පාදනය/ උපකරණ සැපයීම සහ සුසාන භූමි ප්‍රතිසංස්කරණය කිරීම.

2.13 වන සතුන්ගෙන් ජනාවාස සහ වගාවන්ට එල්ලවන උවදුරු දුරු කිරීම හෝ අවම කිරීම සඳහාවන යෝජනා ක්‍රියාත්මක කිරීම.

2.14 සමෘද්ධි දෙපාර්තමේන්තුව මගින් ක්‍රියාත්මක කරනු ලබන දිළිඳු පවුල් සවිබලගැන්වීමේ වැඩසටහන සඳහා (Graduation programme) තෝරාගන්නා පවුල් වෙත ජීවනෝපාය සංවර්ධන කටයුතු සඳහා අවශ්‍ය පහසුකම් සැලසීම.

2.15 ව්‍යාවසායක සමිති, කාන්තා හා යෞවන සමිති සහ ව්‍යවසායක ගම්මාන ප්‍රවර්ධනය සහ නව තාක්ෂණය සැපයීම වැනි ව්‍යවසායකත්ව සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම.

2.16 ස්වභාවික ආපදා හේතුවෙන් පූර්ණ හෝ අර්ධ වශයෙන් විනාශයට පත්වූ යටිතල පහසුකම් ප්‍රතිස්ථාපනය කිරීම.

2.17 ග්‍රාමීය ආර්ථිකය නැංවීම සඳහා ප්‍රාදේශීය වශයෙන් ක්‍රියාත්මක කළ හැකි නව යෝජනා ක්‍රියාත්මක කිරීම.

2.18 ප්‍රමුඛතාවය ලබාදිය යුතු හා බහුමානික දරිද්‍රතා දර්ශකය පදනම් කොටගත් [Multidimensional Poverty Index (MPI)] නිර්ණායකයන්ට අනුකූල වෙනත් සංවර්ධන යෝජනා.

## 3. ව්‍යාපෘති අනුමත කිරීම, ප්‍රතිපාදන නිදහස් කිරීම සහ ක්‍රියාත්මක කිරීම

3.1 ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් සංවර්ධන යෝජනා ඔබ වෙත ලැබුණු වහාම එම යෝජනා මෙම චක්‍රලේඛයේ උපදෙස්වලට අනුකූල බවට තහවුරු කරගෙන 2024 පෙබරවාරි 15 වන දිනට පෙර දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙහි අනුමැතිය සහිතව ඇමුණුම් අංක 03 ආකෘතිය මගින් ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කළ යුතුය.

3.2 ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව මගින් එම යෝජනා පරීක්ෂාකර බලා ප්‍රතිපාදන නිදහස් කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාලය වෙත යොමු කරනු ඇත. ඒ අනුව, ජනාධිපති ලේකම් කාර්යාලය විසින් ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන නිදහස් කරනු ඇත.

3.3 2024 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ අනුමත වූ ව්‍යාපෘති 2024 ජූලි 31 ට පෙර අවසන් කිරීමට කටයුතු කළ යුතුය.

3.4 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ අනුමත වූ යෝජිත ව්‍යාපෘති යෝජනාවක් නොවැළැක්විය හැකි හේතුවක් මත හැර 2024 වර්ෂයේ අප්‍රේල් මස 30 වන දිනෙන් පසුව සංශෝධනය කිරීමට කටයුතු නොකළ යුතුය. එසේ සංශෝධන වන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත 3.1, 3.2 සහ 3.3 ක්‍රමවේදය අනුගමනය කළ යුතුය.

3.5 සියලුම ව්‍යාපෘති රජයේ අනුමත නීතිරීති, චක්‍රලේඛ, ප්‍රසම්පාදන මාර්ගෝපදේශ හා මුදල් රෙගුලාසිවලට අනුකූලව ක්‍රියාත්මක වන බවට දැඩිසේ වගබලා ගත යුතුය.

## 4. වැඩසටහන අධීක්ෂණය

4.1 2024 විමධ්‍යගත අයවැය වැඩසටහනේ ප්‍රාදේශීය සහ දිස්ත්‍රික්ක මට්ටමේ ප්‍රගතිය සතිපතා සමාලෝචනය කිරීමට කටයුතු කළ යුතුය. ඒ සඳහා දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ යටතේ නිසි ක්‍රමවේදයක් සකස් කළ යුතුය.

4.2 2024 විමධ්‍යගත අයවැය වැඩසටහන යටතේ ක්‍රියාත්මක ව්‍යාපෘති, ජාතික මට්ටමේ දී මහා භාණ්ඩාගාරයේ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් අධීක්ෂණය කරනු ලබන අතර ඒ සම්බන්ධ උපදෙස් හා මාර්ගෝපදේශ එම දෙපාර්තමේන්තුව විසින් ඉදිරියේදී නිකුත් කරනු ඇත.

4.3 සමස්ත වැඩසටහන ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පිහිටුවා ඇති අමාත්‍ය මණ්ඩල අනුකමිටුව මගින් අධීක්ෂණය කරනු ලබන අතර මහා භාණ්ඩාගාරයේ ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රගතිය සහ අවශ්‍ය තොරතුරු එම අනුකමිටුව වෙත විටින් විට සපයනු ඇත.

## 5. වෙනත් කරුණු

5.1 ඉදිකිරීම් ව්‍යාපෘති සඳහා එක් එක් ව්‍යාපෘතියේ වටිනාකමින් 3% කට නොවැඩි ප්‍රතිපාදනයක් සහ ඉදිකිරීමක් නොවන ව්‍යාපෘති සඳහා 1% කට නොවැඩි ප්‍රතිපාදනයක් පරිපාලන වියදම් ලෙස වෙන් කළ හැකි අතර එය පහත පරිදි උපයෝජනය කළ යුතුය.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල ආශ්‍රිත කටයුතු සඳහා 25% උපරිමයකට යටත්ව
(ආ) ප්‍රාදේශීය ලේකම් කාර්යාල සහ ක්‍රියාත්මක කරන ආයතන ආශ්‍රිත කටයුතු සඳහා 75% උපරිමයකට යටත්ව

5.2 මෙම වැඩසටහන ක්‍රියාත්මක කිරීම සඳහා පළාත් සභා, දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, පළාත් පාලන ආයතන සහ දිස්ත්‍රික්කය තුළ පිහිටි සියලු රාජ්‍ය හා ව්‍යවස්ථාපිත ආයතනවලට අනුයුක්ත තාක්ෂණික නිළධාරීන් සහ තාක්ෂණික සහායක නිළධාරීන්ගේ සේවය උපරිම අයුරින් දායක කර ගත යුතුය.

5.3 මෙම වැඩසටහන යටතේ 2024 වර්ෂය තුළ ක්‍රියාත්මක කර අවසන් කළ හැකි ව්‍යාපෘති පමණක් හඳුනාගත යුතුය. 2024 වර්ෂයෙන් ඉදිරියට ව්‍යාපෘති අවිච්ඡේද කිරීම කිසිඳු අයුරකින් නොකළ යුතුය.

5.4 පෙර වර්ෂ වලදී මෙන්ම මෙම වර්ෂයේදීත් විමධ්‍යගත අයවැය වැඩසටහන සඳහා ව්‍යාපෘති සකස් කිරීමට අවශ්‍ය සහයෝගය ලබාදීම හා වැඩසටහන සම්බන්ධීකරණය කිරීම සඳහා දිස්ත්‍රික් ක්‍රමසම්පාදන ලේකම් කාර්යාලයට අනුයුක්ත නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂවරුන් (ක්‍රමසම්පාදන) දෙදෙනකු අනුයුක්ත කිරීමට පියවර ගත යුතුය.

5.5 විමධ්‍යගත අයවැය වැඩසටහන 2024 ට අදාල කාල රාමුවට ඇතුළත් ක්‍රියාකාරී සැලැස්ම මේ සමග අමුණා ඇත (ඇමුණුම 04).

5.6 විමධ්‍යගත අයවැය වැඩසටහන 2024 මගින් ක්‍රියාත්මක වන ව්‍යාපෘති වෙනුවෙන් ගෙවීමට සිදුවන සියලුම ආකාරයේ බදු හා වෙනත් ගෙවීම් මෙම වැඩසටහන යටතේ ලබාදෙන ප්‍රතිපාදන මගින්ම ආවරණය කර ගත යුතු අතර ඒ සඳහා අමතර ප්‍රතිපාදන හිමි නොවේ.

5.7 මෙම චක්‍රලේඛයෙන් ආවරණය නොවන කාර්යයක් වේ නම්, එම ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශය වෙතින් විශේෂ අනුමැතියක් ලබා ගත යුතුය.

කේ. එම්. මහින්ද සිරිවර්ධන
ලේකම්

පිටපත් -

1. ගරු පළාත් ආණ්ඩුකාරවරු - කාරුණික දැන ගැනීම පිණිස
2. සියළුම දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සභාපතිවරු - කාරුණික දැන ගැනීම පිණිස
3. ජනාධිපති ලේකම් - කාරුණික දැන ගැනීම පිණිස
4. අග්‍රාමාත්‍ය ලේකම් - කාරුණික දැන ගැනීම පිණිස
5. සියලුම පළාත් ප්‍රධාන ලේකම්වරුන් - කාරුණික දැනගැනීම පිණිස
6. විගණකාධිපති - විගණකාධිපති දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම පිණිස
7. ලේකම්, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය - කාරුණික දැනගැනීම පිණිස
8. ලේකම්, කාන්තා, ළමා කටයුතු සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය - කාරුණික දැනගැනීම පිණිස
9. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම හා අ.ක.ස
10. අධ්‍යක්ෂ ජනරාල් - ජාතික අයවැය දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම හා අ.ක.ස
11. අධ්‍යක්ෂ ජනරාල් - ව්‍යාපෘති කළමනාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම හා අ.ක.ස
12. අධ්‍යක්ෂ ජනරාල් - භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව- කාරුණික දැනගැනීම හා අ.ක.ස
13. අධ්‍යක්ෂ ජනරාල් - සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - කාරුණික දැනගැනීම හා අ.ක.ස
14. සියලුම දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂවරුන් - කාරුණික දැනගැනීම හා අ.ක.ස
15. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් - කාරුණික දැනගැනීම හා අ.ක.ස

ඇමුණුම 1

විමධ්‍යගත අයවැය වැඩසටහන - 2024

දිස්ත්‍රික්කයට වෙන්කෙරෙන මුලු ප්‍රතිපාදනය

| අනු අංකය | දිස්ත්‍රික්කය | 2024 වෙන්වන ප්‍රතිපාදනය රු. මිලියන |
|---|---|---|
| 1 | කොළඹ | 1,090.00 |
| 2 | ගම්පහ | 1,033.00 |
| 3 | කළුතර | 574.00 |
| 4 | මහනුවර | 689.00 |
| 5 | මාතලේ | 287.00 |
| 6 | නුවරඑළිය | 460.00 |
| 7 | ගාල්ල | 516.00 |
| 8 | මාතර | 402.00 |
| 9 | හම්බන්තොට | 402.00 |
| 10 | යාපනය | 322.00 |
| 11 | කිලිනොච්චි | 80.00 |
| 12 | වවුනියාව | 115.00 |
| 13 | මන්නාරම | 115.00 |
| 14 | මුලතිව් | 115.00 |
| 15 | මඩකලපුව | 287.00 |
| 16 | අම්පාර | 402.00 |
| 17 | ත්‍රිකුණාමලය | 230.00 |
| 18 | කුරුණෑගල | 860.00 |
| 19 | පුත්තලම | 459.00 |
| 20 | අනුරාධපුරය | 517.00 |
| 21 | පොළොන්නරුව | 287.00 |
| 22 | බදුල්ල | 516.00 |
| 23 | මොණරාගල | 344.00 |
| 24 | රත්නපුර | 631.00 |
| 25 | කෑගල්ල | 517.00 |
| එකතුව | | 11,250.00 |

## යෝජිත ඉදිකිරීම් ව්‍යාපෘති මූලික ශක්‍යතා අධ්‍යයන වාර්තාව - 2024

01. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය :
02. ග්‍රාම නිලධාරී වසමේ නම හා අංකය :
03. යෝජිත ව්‍යාපෘතියේ නම :
04. මෙම වැඩසටහන යටතේ වෙන් කිරීමට යෝජිත ප්‍රතිපාදන මුදල (රු). :
05. ව්‍යාපෘතියේ ස්වභාවය (√) යොදන්න:

I. සම්පූර්ණයෙන්ම නව ඉදිකිරීමකි ☐
II. නව ඉදිකිරීමකි (එක් කොටසක් වශයෙන්/එක් අදියරක් වශයෙන්) ☐
III. පවතින ව්‍යාපෘතියක කොටසකි ☐
IV. පවතින ව්‍යාපෘතියක අළුත්වැඩියාවකි / ප්‍රතිසංස්කරණයකි ☐

6. ඉහත අනු අංක 5. යටතේ හඳුනාගත් ව්‍යාපෘතිය පිළිබඳ පහත තොරතුරු සපයන්න

6.1. ව්‍යාපෘතිය සඳහා යෝජිත ඉඩම රජයට අයත්ද? ඔව්/නැත
නැති නම් රජයට පවරා දීමට යෝජිත ඉඩම නිරවුල් ද? ඔව්/නැත

ඉඩම නිරවුල් නම්, ඒ සඳහා අදාළ ඉඩමේ හිමිකාරිත්වය විසින් ලිඛිතව
එකඟතාවය ලබා දී තිබේ / එකඟතාවය ලබා දීමට කැමැත්ත ප්‍රකාශ කර ඇත ඔව්/නැත

6.2. අදාළ ඉදිකිරීම සිදුකිරීමට විශේෂයෙන් පහත ආයතනයකින් හෝ ආයතන කිහිපයකින් එකඟතාවය ලබාගැනීම අවශ්‍ය නම්, ඒ බව සඳහන් කරන්න

| අනු. අංකය | ආයතනය | එකඟතාවය ලබාගත යුතු ද නැද්ද යන වග | අදාළ ආයතනයෙන් එකඟතාවය ලබාගත හැකිවේද? |
|---|---|---|---|
| 1 | මධ්‍යම පරිසර අධිකාරිය | ඔව්/නැත | ඔව්/නැත |
| 2 | භූවිද්‍යා හා පතල් කැනීම් කාර්යාංශය | ඔව්/නැත | ඔව්/නැත |
| 3 | වන සංරක්ෂණ දෙපාර්තමේනතුව | ඔව්/නැත | ඔව්/නැත |
| 4 | වන ජීවී දෙපාර්තමේනතුව | ඔව්/නැත | ඔව්/නැත |
| 5 | පළාත් පාලන ආයතනය ( සඳහන් කරන්න ) | ඔව්/නැත | ඔව්/නැත |
| 6 | වාරිමාර්ග දෙපාර්තමේන්තුව | ඔව්/නැත | ඔව්/නැත |
| 7 | විදුලිබල මණ්ඩලය | ඔව්/නැත | ඔව්/නැත |
| 8 | ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය | ඔව්/නැත | ඔව්/නැත |
| 9 | වෙනත් (සඳහන් කරන්න ) | ඔව්/නැත | ඔව්/නැත |

7. පසුගිය වර්ෂවල සිදුකළ ආයෝජනයන් පිළිබඳ විස්තර

7.1. ආසන්න වර්ෂ 04 තුළ මෙම ව්‍යාපෘතියේ යෝජිත කාර්යයන් සඳහා
කිසියම් ආයතනයක් මුදල් ආයෝජනය කර තිබේද? ඔව්/නැත

ඔව් නම්, පහත සඳහන් ආකෘතිය සම්පූර්ණ කරන්න

| වර්ෂය | මුදල (රු.) | ආයෝජනය කළ ආයතනය | විශේෂ කරුණු (ඇත්නම්) |
|---|---|---|---|
| 2023 | | | |
| 2022 | | | |
| 2021 | | | |
| 2020 | | | |

7.2. එසේ නම් ව්‍යාපෘතියේ වැඩ සම්පූර්ණයෙන් නිම කර තිබේද? ඔව්/ නැත

**8. 2024 මුදල් ආයෝජන පිළිබඳ විස්තර**

8.1 මෙම ව්‍යාපෘතිය සඳහා මෙම වසරේ වෙනත් මූලාශ්‍රයකින් මුදල් වෙන් වී හෝ
වෙන් කිරීමට නියමිතව තිබේද? ඔව්/ නැත

8.2. ඉහත 8.1 යටතේ ඔව් නම් පහත තොරතුරු සපයන්න

| මූලාශ්‍රය | අමාත්‍යාංශය/ ආයතනය | ආවරණය වන වැඩ කොටස | මුදල (රු.) | එමගින් ව්‍යාපෘතිය සම්පූර්ණ කල හැකිද? |
|---|---|---|---|---|
| 1. | | | | ඔව්/නැත |
| 2. | | | | ඔව්/නැත |

8.3. යෝජිත ව්‍යාපෘතිය නිම කිරීමට යෝජනා කර ඇති ප්‍රතිපාදන ප්‍රමාණවත් වේ. / ප්‍රමාණවත් නොවේ.

8.4. මෙම ආයෝජන මගින් ව්‍යාපෘතිය

i. සම්පූර්ණයෙන් නිම වේ /කොටසක් සම්පූර්ණ වේ / තවදුරටත් ඉදිරියේ දී මෙම ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට රු.________________ ක ප්‍රතිපාදන (දළ වශයෙන්) යෙදවිය යුතුය.

8.5. සංවර්ධනය කිරීමට යෝජිත මෙම ව්‍යාපෘතිය දැනට හොඳ මට්ටමක පවතීද? ඔව්/නැත
ඒ අනුව, යෝජිත ප්‍රතිපාදනය වෙන් කළ යුතු **නොවේ / කල යුතු වේ.**

09. යෝජිත ව්‍යපෘතියෙන් බලාපොරොත්තු වන නිමවුම / ප්‍රතිලාභීන් සංඛ්‍යාව පිළිබඳ විස්තර

i. **මාර්ග ව්‍යාපෘතියක් නම් අලුතින් වැඩි දියුණු කරන / අලුතින් ඉදි කෙරෙන දුර ප්‍රමාණය - (මීටර්/ කි.මී)................**

ii. **කෘෂිකර්ම / වාරිමාර්ග ව්‍යාපෘතියක් නම් දුර (මී/කි.මී)....... අලුතින් අස්වැද්දෙන බිම් ප්‍ර. (අක්).....**

iii. ප්‍රතිලාභීන් සංඛ්‍යාව - පවුල්:--------- පුද්ගල - (ස්ත්‍රී):- --------- (පුරුෂ):- ---------

10. ව්‍යාපෘතිය මගින් ග්‍රාමීය ප්‍රජාවට සැලසෙන ප්‍රධාන ප්‍රතිලාභ සඳහන් කරන්න

i.

ii.

iii.

11. ප්‍රදේශයේ ග්‍රාමීය ප්‍රජා අවශ්‍යතා අතර මෙම ව්‍යාපෘතිය, <u>අත්‍යාවශ්‍යයි/ අවශ්‍යයි/ ප්‍රමුඛ නැත/ අවශ්‍ය</u> නැත

12. 2021 වර්ෂය තුළ මෙම ව්‍යාපෘතිය නිම කළ හැකිද? හැකිය/නොහැකිය

13. ඔව් නම් ඒ සඳහා ගත විය හැකි කාලය: - ............. සිට .................. දක්වා මාස / සති ................................

14. ව්‍යාපෘතියේ නඩත්තු කටයුතු

14.1. නිමවූ පසු නඩත්තුව බාරවන ආයතනය - ...................................... ....................................... ..........

14.2 නිමවූ පසු නඩත්තු වැඩ පිළිවලක් තිබේද ? විස්තර දක්වන්න - ...................................... ......................
........................................ ...................... ....................................... ..................... .................................

15. මෙම ව්‍යාපෘතිය පිළිබඳව ක්ෂේත්‍ර පරීක්ෂාවක් සිදුකරන ලදී / සිදු නොකරන ලදී.

ඉහත තොරතුරු සත්‍ය බවට සහතික කරමි.

............................ දිනය:-

සංවර්ධන නිළධාරී / සංවර්ධන සහකාර
ග්‍රාම නිළධාරී වසම (නම හා අංකය)

ඉහත තොරතුරු පිළිබඳව සලකා බලා උක්ත ව්‍යාපෘතිය 2024 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීම සුදුසු බවට / නුසුදුසු බවට <u>නිර්දේශ කරමි</u>.

.................................. දිනය:-

නියෝජ්‍ය / සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන)
(මුද්‍රාව)

ඉහත තොරතුරු පිළිබඳව සලකා බලා උක්ත ව්‍යාපෘතිය 2024 වර්ෂයේ දී ක්‍රියාත්මක කිරීම සුදුසු බවට / නුසුදුසු බවට සහතික කරමි.

......................... දිනය:-

ප්‍රාදේශීය ලේකම්
(මුද්‍රාව)

## විමධ්‍යගත අයවැය වැඩසටහන 2024

## ක්‍රියාකාරී සැලැස්ම

| අනු අංකය | කාර්යය | ඉලක්කය | වගකීම |
|---|---|---|---|
| 01 | ප්‍රජාව දැනුවත් කිරීම සහ ව්‍යාපෘති හඳුනා ගැනීම | **2024 ජනවාරි මස 31** වන දිනට පෙර | දිස්ත්‍රික් ලේකම්,<br>දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ.<br>ප්‍රාදේශිය ලේකම්.<br>නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 02 | අදාල ව්‍යාපෘති යෝජනා 2024 වර්ෂය තුල ක්‍රියාත්මක කර අවසන් කල හැකි බවට සහතික වීම | ව්‍යාපෘති යෝජනා හඳුනාගෙන සතියක් තුල | ප්‍රාදේශිය ලේකම්.<br>නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 03 | ප්‍රාදේශිය සම්බන්ධීකරණ කමිටුවෙ අනුමත කරන ලද ව්‍යාපෘති යෝජනා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවෙ අනුමැතිය සහිතව ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත යොමු කිරීම | **2024 පෙබරවාරි 15** වන දිනට පෙර | දිස්ත්‍රික් ලේකම්,<br>දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ,<br>නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 05 | ව්‍යාපෘති යෝජනා පරික්ෂාකර බලා ප්‍රතිපාදන නිදහස් කිරීම සඳහා ජනාධිපති ලේකම් කාර්යාල වෙත යොමු කිරීම | **2024 පෙබරවාරි 29** වන දිනට පෙර | අධ්‍යක්ෂ ජනරාල්, ජාතික ක්‍රමසම්පාදන දෙපාර්තමේන්තුව |
| 04 | අනුමත කරනලද ව්‍යාපෘති යෝජනා ක්‍රියාත්මක කිරීම | **2024 ජුලි මස 30** වන දිනට පෙර | දිස්ත්‍රික් ලේකම්,<br>දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ.<br>ප්‍රාදේශිය ලේකම්.<br>නියෝජ්‍ය/සහකාර අධ්‍යක්ෂ (ක්‍රමසම්පාදන) |
| 06 | ක්‍රියාත්මක වන ව්‍යාපෘතීන්වල මාසික භෞතික හා මූල්‍ය ප්‍රගතිය වාර්තා කිරීම | සති ප්‍රගති වාර්තා කිරීම | දිස්ත්‍රික් ලේකම්,<br>දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ<br>ප්‍රාදේශිය ලේකම් |
| | | ජාතික මට්ටමේ අධීක්ෂණය සහ ගරු අග්‍රාමාත්‍යතුමාගේ ප්‍රධානත්වයෙන් පිහිටුවා ඇති අමාත්‍ය මණ්ඩල අනුකමිටුව වෙත තොරතුරු වාර්ථා කිරීම | අධ්‍යක්ෂ ජනරාල්, ව්‍යාපෘති කළමණාකරණ හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව<br>දිස්ත්‍රික් ලේකම්<br>දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ |

ඇමුණුම 04

## විමධ්‍යගත අයවැය වැඩසටහන - 2024

දිස්ත්‍රික්කය-

දිස්ත්‍රික්කයට වෙන්වන මුළු ප්‍රතිපාදනය -

| අ. අංකය | ප්‍රා.ලේ. කොට්ඨාශය | ව්‍යාපෘතියේ නම | චක්‍රලේඛයේ <u>2. සංවර්ධන අංශ</u> අනුව අයත්වන සංවර්ධන අංශය | 1<br>ඉදිකිරීම් ව්‍යාපෘති (දිස්ත්‍රික්කයට වෙන්වන මුළු ප්‍රතිපාදයෙන් අවම 50%) රු. | 2<br>අනෙකුත් ව්‍යාපෘති රු. | 1 + 2 රු. |
|---|---|---|---|---|---|---|
| 1 | | | | | | |
| 2 | | | | | | |
| 3 | | | | | | |
| 4 | | | | | | |
| 5 | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| | | | | | | |
| එකතුව | | | | - | - | - |

සකස් කලේ-

නිර්දේශය

.........................................................
දිස්ත්‍රික් ක්‍රමසම්පාදන අධ්‍යක්ෂ

අනුමැතිය

.........................................................
දිස්ත්‍රික් ලේකම්